# නාට්‍ය හා රංගකලාව

## 07 ශ්‍රේණිය - දෙවන වාරය

## හයවන පාඩම

## කතා ගොතමු - ගොතා කියමු

❖ **සාර්ථක කතන්දරයක මූලික ලක්ෂණ ලෙස,**

- කතාවක මුලක් මැදක් හා අගක් ඇත.
- එම කොටස් මනා ව ගැලැපීමෙන් රසවත් කතාවක් නිර්මාණය වී ඇත.
- එම කතාවට සිද්ධි රැසක් පාදක වී තිබිය හැකි ය.
- එම සිද්ධි ගෙත්තමක් මෙන් එකින් එක බැඳී පවතී.
- ඉන් එක සිද්ධියක් හෝ ඉවත්කළ විට එම කතාවේ ඒකාබද්ධතාව බිඳී යන අතර එය කතාවේ රසවින්දනයට බාධාවක් වේ.
- සිද්ධි මනා ව ගැලැපීම කතාව සාර්ථක වීමට අත්‍යවශ්‍ය වේ

ක්‍රියාකාරකම :

- කවයක් සේ සිටගන්න.
- එක් සිසුවෙකු කුමන හෝ කතාවක් ආරම්භ කරන්න.
  උදා : - එක ගමක හිටියා දිග රැවුලක් තියන මිනිහෙක්,
- රවුමේ ඊලඟ සිසුවා එම කතාවට ම කුඩා කොටසක් එක් කළ යුතු ය. (ගැලපෙන අන්දමින්)
- එක් එක් සිසුවාගේ වාරය පැමිණි විට මුල් කතාවට උචිත ආකාරයෙන් එය ඉදිරියට ගොඩනැගිය යුතු ය.
- යම් ගැටුමක් නිර්මාණය වී එය සමතයකට පත්වන ආකාරයේ අවසානයක් සහිතව කතාන්දරය ගොඩනැගිය යුතු ය.

එක් එක් සිසුවාගේ නිර්මාණශීලි බව අනුව කතන්දරයේ අවස්ථා හා සිද්ධි ගැලපීම සාර්ථක හෝ අසාර්ථක විය හැකි ය. කීප වාරයක් කතා ගොතාගෙන යාමේ දී සාර්ථක කතාන්දර නිර්මාණය විය හැකි ය

### අභ්‍යාස

- ඔබ කැමති තේමාවක් ඔස්සේ කුඩා කතාවක් නිර්මාණය කරන්න. චිත්‍ර ද ඇතුලත් කර පොතක් ලෙස සකස් කරන්න. සුදුසු නමක් ද යොදන්න